ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය, කොළඹ
මාධ්‍ය නිවේදනය
මහජන සම්බන්ධතා අංශය
දුරකථන : +94 (1) 249-8100 ● ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපෑලl: VanHornNT@state.gov ● http://lk.usembassy.gov

නිවේදන අංකය. 20171027b

**ස්වාභාවික ආපදා සඳහා පෙර සූදානම්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම ශක්තිමත් කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය USAID ශ්‍රී ලංකාව සමග එක්ව කටයුතු කරයි.**

ඔක්තෝබර් මස 27 වන දින කොළඹදී - ආපදා පෙර සූදානම් වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා මෙන් ම නිතර නිතර ඇතිවන හදිසි ගංවතුර සහ නාය යාම් තත්ත්වයන් හේතුවෙන් සිදුවන ජීවිත සහ දේපල හානි අවම කර ගැනීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය USAID ශ්‍රී ලංකා රජය සමග ඉතා සමීපව කටයුතු කරයි. ශ්‍රී ලංකාව කලාපීය හදිසි ගංවතුර මාර්ගෝපදේශ පද්ධතියක් තුළට ඇතුළු කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමග කටයුතු කිරීමට ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ හදිසි ගංවතුර මාර්ගෝපදේශ පද්ධතියක් තුලට ඇතුළු කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමග කටයුතු කිරීමට ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ හදිසි ගංවතුර මාර්ගෝපදේශ පද්ධතියේ (හ.ග.මා.ප.) ප්‍රධාන සැලසුම්කරු වන ආචාර්ය කොන්ස්ටන්ටයින් පී. ජෝගතාකෝස් මහතා (USAID) ආයතනය විසින් මෑතදී ශ්‍රී ලංකාවට රැගෙන එන ලදී.

අවදානම් පාත්‍ර ප්‍රජාවන් හට සිය නිවෙස් වලින් කල්වේලා ඇතිව ඉවත්වීම සඳහා අවශ්‍ය නිරවද්‍ය අනාවැකි සපයා දීම සඳහා හ.ග.මා.ප. විසින් ස්වයංක්‍රීය වැසි මාපක වලින් දත්ත ලබා ගෙන චන්ද්‍රිකා මගින් ලබා ගන්නා ගෝලීය දත්ත සමග ඒවා බද්ධ කරනු ලබයි.ශ්‍රී ලංකාවේ දැනට පවතින තත්ත්වය අධ්‍යයනය කළ ආචාර්ය කොන්ස්ටන්ටයින් ඒවා තවදුරටත් වර්ධනය කිරීමේ ඉඩකඩ ගවේෂණය කළේය. මෙම සාමූහිකත්වය තුළ නවීන ක්‍රම, චන්ද්‍රිකා තොරතුරු, ස්වයංක්‍රිය සංවේදක සහ කාලගුණ අනාවැකි පිළිබඳ දීර්ඝ පුහුණු ඇතුලත් වන අතර, දකුණු ආසියානු කලාපීය පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සහාය USAID ලෝක කාලගුණ සංවිධානය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජාතික සාගරික සහ වායුගෝලීය පරිපාලන ආයතනය විසින් සපයා දේ.

ආචාර්ය හෙන්ස්ටන්ටයින් මහතාගේ සංචාරය USAID ආයතනය විසින් දැනටමත් ක්‍රියාත්මක කරමින් තිබෙන ප්‍රතිචාර සහ නැවත ගොඩනැගීමේ වැඩසටහන් සහ ප්‍රජාව හරහා බිම් මට්ටමට

ගොස් ආපදා සඳහා ප්‍රාදේශීය වශයෙන් ප්‍රතිචාර දැක්වීම දිරිමත් කිරීමේ ව්‍යායාමය තවදුරටත් ශක්තිමත් කරන අතර ආගමික විශ්වාසයන් පාදක ක්‍රියාධරයින් සහ ජාලයන් හට ආපදාවන්ගෙන් පීඩාවට පත්වන ජනතාවට අවශ්‍ය ආධාර ලබාදීම ඉහළ දැමිය හැකිය.

USAID පිළිබඳව

USAID යනු ඇ.එ.ජනපද රජයේ සංවර්ධන නියෝජිතායතනය වන අතර එමගින් වසර 55කට අධික කාලයක් තිස්සේ සංවර්ධනය වන රටවලට අවශ්‍ය සංවර්ධන සහ මානුෂීය සහාය ලබා දී ඇත. 1956 වසරේ සිට ඇ.එ.ජනපද රජය විසින් ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන දෙකකට අධික මුදලක් සංවර්ධන සහාය ලෙස ලබා දී ඇත.